# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2045/19 – 2017 නොවැම්බර් 15 වැනි බදාදා – 2017.11.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 501ඩී - කවටයාමාන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ගන්නෑව කෝරලේ සුළු කොට්ඨාසයේ, කවටයාමාන ගමේ පිහිටි, නුවරඑළිය දිස්ත්‍රික් භාර මැනුම් අධිකාරී විසින් පිළියෙල කරන ලද අංක එන්යු/එච්කේටී/2016/128 හා 2016.09.08 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – රහතුන්ගොඩවත්ත – ප්‍රමාණය: හෙක්. 1.6187

උතුරට: මාර්ගය (ප්‍රා.ස.) සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලය හිමිකම් කියන රහතුන්ගොඩවත්ත; නැගෙනහිරට: ජනතා වතු සංවර්ධන මණ්ඩලය හිමිකම් කියන රහතුන්ගොඩවත්ත; දකුණට: ජනතා වතු සංවර්ධන මණ්ඩලය හිමිකම් කියන රහතුන්ගොඩවත්ත සහ මාර්ගය (ප්‍රා.ස.); බටහිරට: මාර්ගය (ප්‍රා.ස.).

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/2/2016/සීඊබී/113.
2017 සැප්තැම්බර් මස 25 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11 – 1319


1A – G 26591 – 17 (2017/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*